## දෙවිනුවර ප්‍රාදේශීය සභාව
## මාතර දිස්ත්‍රික්කය

1. මූල්‍ය පකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 30 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 ජුලි 02 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 දෙසැම්බර් 30 දින සභාවේ සභාපතිවරයාවෙත යවා ඇත.

1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති දෙවිනුවර ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම් කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට සෞඛ්‍ය කම්කරුවෙකු වෙත ගෙවිය යුතුව තිබුණු හිඟ වැටුප වූ රු.412,038 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) ගන්දර උප කාර්යාලයෙහි සමාලෝචිත වර්ෂයට බිල්කල රු.878,400 ක බදුකුලී වටිනාකම වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම් ගතකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.399,106 ක් වූ අත ඉතිරි මුදල් , මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

(ඈ) සභාව සතු අක්‍රිය බැංකු ගිණුම් 04 කදීර්ඝ කාලයක සිට පැවති එකතුව රු. 802,817 ක් වූ ශේෂයන් පිළිබඳ කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඉ) වර්ෂ කිහිපයක් තිස්සේ ඉදිරියට ගෙනවිත් තිබුණු රු.821,986 ක ගිණුම් මාරු ගිණුමේ බැර ශේෂය සමාලෝචිත වර්ෂයේදද නිරවුල් කර නොතිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 08 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.16,913,868 ක් වූ අතර උපයෝගී ලේඛණ අනුව හා ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.16,358,800 ක් වූයෙන් රු.555,068 වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

2012 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු145,187 ක් වූ අතර අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.17,536,710 ක් විය.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

ගිණුම්වල ඇතුලත් රු.75,421,844 ක් වූ විෂයයන් 11 ක් සාක්ෂි නොමැතිවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.11,702,562 ක් වූ අතර, එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,500,599 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.'000 | රු.'000 | රු.'000 |
| (i) | වරිපනම් හා බදු | 2,366 | 1,865 | 2,625 |
| (ii) | බදුකුලී | 18,255 | 12,231 | 4,774 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 408 | 233 | 28 |
| (iv) | වෙනත් ආදායම් | 25,133 | 30,926 | 18,212 |

2.2.2 මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට රු.11,322,794 ක මුද්දර ගාස්තු අයවීමට තිබුණි.

2.2.3 කඩ බදු

සභාවට අයත් නව වෙළඳ සංකීර්ණය, පැරණි වෙළඳ සංකීර්ණය හා ගන්දර වෙළඳ පොල ඇතුළත් කඩ කාමර 111 කින් රු.3,981,474 ක මුදලක් 2012 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ අතර විගණිත දිනය වූ 2013 සැප්තැම්බර් 24 දින වන විටත් එකී මුදල් අයකර ගැනීමට කටයුතු නොතිබුණි.

2.3 අවිධිමත් ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 අප්‍රේල් 22 දිනැති අංක 1807/2 දරන ශ්‍රී ලංකා ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද නිවේදනයේ විධිවිධාන අනුව මහජන නියෝජිතයෙකු වශයෙන් පැවරී ඇති කාර්යයන්/සභාව විසින් පවරන ලද කාර්යයන් වෙනුවෙන් ගමන් වියදම් දීමනාවක් ගෙවිය හැකි වුවද එලෙස කිසිදු කාර්ය පැවරුමක් සිදු නොකර සභාපතිවරයා ඇතුළු මන්ත්‍රීවරුන් 9 දෙනෙකුට 2012 වර්ෂයේදී රු.390,000 ක් ගමන් වියදම් දීමනා ලෙස ගෙවා තිබුණි.

(ආ) දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාගේ 2005 ඔක්තෝබර් 05 දිනැති අංක 1413/15 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද නිවේදනයේ 3 වන රීතිය (1)(1) වගන්තියට පටහැනිව මන්ත්‍රී දීමනා ගෙවීමේදී අදාල මාසයේ පවත්වන ලද සභා රැස්වීම් සහ කාරක සභා රැස්වීම් වලට සහභාගී වී නොතිබූ හා 3 රීතියේ 1(iii) ඡේදය පරිදි වෛද්‍ය හේතූන් මත නිවාඩු හෝ 3 (2) ඡේදය පරිදි විධිමත් අනුමැතියක් ලබානොගෙන සභා රැස්වීම් වලට සහභාගී නොවූ උප සභාපති ඇතුළු මන්ත්‍රීවරුන් 5 දෙනෙකු සඳහා රු.56,500 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදි සභා අරමුදලින් ගෙවා තිබුණි.

2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණන් කරනු ලැබේ.

2.4.1 1988 අංක 74 දරන පනතින් සංශෝධිත 1975 අංක 01 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ පනත පරිදි ප්‍රාදේශීය සභාවේ සභාපති ඇතුළු මන්ත්‍රීවරුන් 09 දෙනෙකු 2012 වර්ෂයේදී වත්කම් හා බැරකම් ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි.

2.4.2 2005 මාර්තු 31 දිනැති අංක 08/2005 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 11.5 වගන්තිය පරිදි දේපල ණය සඳහා බැංකු පොලී අනුපාතය හා නිලධාරියාගෙන් අයකළ සියයට 4ක පොලිය අතර වෙනස රජය මගින් ප්‍රතිපූර්ණය කළ යුතුය. ඒ අනුව සභා අරමුදලින් ගෙවන ලද පොලිය අය කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයට අදාල රු.1,065,714 ක පොලී ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

2.4.3 රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන ලිපිය පරිදි 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කළයුතු වුවත් එසේ පිළියෙල කර නොතිබුණු අතර වර්ෂයට අදාලව ක්‍රියාකාර සැලැස්මක්ද පිළියෙල කර නොතිබුණි.

## 2.5 වීථි පහන් නඩත්තුව හා පාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවේ වීථි පහන් නඩත්තුව සඳහා 2012 වර්ෂයේ අයවැය ලේඛණය අනුව ඇස්තමේන්තු කළ වීථි පහන් වියදම රු.805,000 ක් වූ අතර තථ්‍ය වියදම රු.885,188 ක් විය. සභා බල ප්‍රදේශය තුල පවත්වාගෙන යනු ලබන අනුමත වීථි පහන් සංඛ්‍යාව 157 ක් වුවද නඩත්තු කරනු ලබන සංඛ්‍යාව පහන් 2000 ඉක්මවා තිබුණි.

(ආ) 2012 වර්ෂයට සභා බල ප්‍රදේශය තුල වීථි පහන් උපකරණ මිළදී ගැනීම සඳහා රු.265,395 ක් ද, වීථි පහන් නඩත්තුකරුගේ වැටුප් වියදම ලෙස රු.555,049 ක්ද, වීථි පහන් නඩත්තු වාහනය සඳහා රු.64,745 ක්ද වශයෙන් එකතුව රු.885,188 ක් වැයකර තිබුණද ලංකා විදුලි බල මණ්ඩලය මගින් වර්ෂයට අදාලව ප්‍රතිපූර්ණය කර තිබුනේ රු.74,052 ක මුදලක් පමණි.

(ඇ) විදුලි බල හා බල ශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ 2012 අගෝස්තු 17 දිනැති අංක පීඊ/01/01 දරන චක්‍රලේඛ ලිපිය පරිදි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පොදු කාර්ය සිල්ලර පාරිභෝජනයෙන් සියයට 3 ප්‍රමාණයක් නොඉක්මවිය යුතු බව දක්වා තිබුණද සභාව එකී සීමාව ගණනය කර වීථි පහන් සවි කිරීමට ලංකා විදුලිය බල මණ්ඩලය සමඟ ගිවිසුම්ගත බැඳීම් ඇතිකරගෙන නොතිබුණි.

(ඈ) සභා බල ප්‍රදේශයේ වීථි පහන් කණු අංක කිරීමක් හෝ වෙනත් හඳුනා ගත හැකි ක්‍රමවේදයක් 2013 නොවැම්බර් 30 දක්වාම අනුගමනය කර නොතිබුණෙන් සවිකල වීථි පහන් සංඛාව පිළිබඳව තහවුරු කරගත නොහැකි විය.

## 2.6 මානව සම්පත් කළමනාකරණය

(අ) 2012 දෙසැම්බර් 31 දිනට විගණනයට ලබාදී ඇති තොරතුරු අනුව සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 68 දෙනෙක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 69 දෙනෙක් විය. සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් ගිණුම අනුව කාර්යය මණ්ඩල වැටුප් හා මන්ත්‍රී දීමනා සඳහා වූ වියදම රු.18,702,855 ක් වුවද පළාත් පාලන කොමසාරිස් විසින් ප්‍රතිපූර්ණය කර තිබුණේ රු.12,965,500 ක් පමණක් වූයෙන් රු.5,737,355 ක් වූ වෙනස සභා අරමුදලට අතිරේක වැය බරක් වී තිබුණි.

(ආ) 2002 ජනවාරි 03 හා 2006 අප්‍රේල් 10 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 14 හා අංක 28 මගින් පළාත් පාලන ආයතනවල අනියම්, ආදේශක හා කොන්ත්‍රාත් සේවකයින් බඳවාගැනීම අත්හිටුවා ඇතත් එකී විධිවිධාන වලට පටහැනිව සේවකයින් 27 දෙනෙකු බඳවා ගෙන සමාලෝචිත වර්ෂයේදී වැටුප් වශයෙන් සභා අරමුදලින් රු.2,513,885ක මුදලක් ගෙවා තිබුණි. මෙම චක්‍රලේඛ උපදෙස් අභිබවා මින් බඳවා ගැනීම් සිදුකළහොත් ආයතන ප්‍රධානියා ඒ සඳහා පුද්ගලිකව වගකීමෙන් බැඳී සිටින බවද එහි අවධාරණය කර තිබුණි.

## 2.7 අභ්‍යන්තර විගණනය

සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවා නොතිබුණි.

3. පද්ධති හා පාලන

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඇ) ගබඩා පාලනය